## ආරක්ෂක සේවා සැපයීම - 2026/2027
## ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - බදුල්ල

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පහත සඳහන් රෝහල් සහ සෞඛ්‍ය ආයතන වලට **2026.04.01** දින සිට **2027.03.31** දක්වා වසරක කාලයක් සඳහා ආරක්ෂක සේවා සැපයීමට ආරක්ෂක සේවාවන් සපයන පිළිගත් ලියාපදිංචි ආයතන සහ පුද්ගලයින්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| පැකේජ් අංකය | රෝහල / සෞඛ්‍ය ආයතනය | ලංසු ආකෘති පත්‍ර ගාස්තුව (රු:) | ලංසු සුරක්ෂණ ගාස්තු (මුදලින්) (රු:) |
|---|---|---|---|
| A ශ්‍රේණියේ මූලික රෝහල් | | | |
| 01 | මූලික රෝහල - දියතලාව | 12,500.00 | 584000.00 |
| 02 | මූලික රෝහල - මහියංගණය | 16,000.00 | 793,000.00 |
| B ශ්‍රේණියේ මූලික රෝහල් | | | |
| 03 | මූලික රෝහල - බිබිල | 12,500.00 | 584,000.00 |
| 04 | මූලික රෝහල - වැලිමඩ හා බණ්ඩාරවෙල | 10,000.00 | 375,500.00 |
| 05 | මූලික රෝහල, සියඹලාණ්ඩුව | 8000.00 | 209,000.00 |
| 06 | මූලික රෝහල, වැල්ලවාය | 9,000.00 | 313,000.00 |
| A ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් | | | |
| 07 | පස්සර හා බුත්තල ප්‍රාදේශීය රෝහල් | 8,000.00 | 209,000.00 |
| B ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් | | | |
| 08 | මීගහකිවුල, ගිරාඳුරුකෝට්ටේ, තණමල්විල, මැදගම ප්‍රාදේශීය රෝහල් | 9,000.00 | 271,500.00 |
| C ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් | | | |
| 09 | ඉඟිනියාගල ,කතරගම, දඹගල්ල, කොටියාගල, දඹාන ප්‍රාදේශීය රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලාව හා පුණරුත්ථාපන ඒකකය මීදුම්පිටිය හා ප්‍රාදේශීය රෝහල් - 11 ක් සඳහා | 12,500.00 | 563,500.00 |
| සෞඛ්‍ය ආයතන | | | |
| 10 | සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල, පළාත් සහා නව ගොඩනැගිලි සංකීර්ණය - බදුල්ල , ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය බදුල්ල හා මොණරාගල , ප්‍රාදේශීය මැලේරියා කාර්යාලය, ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය, හුලංදාව දකුණ කෘමිනාශක ගබඩාව (මොණරාගල), කතරගම පූජා නගර බහු සායන මධ්‍යස්ථානය සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | 15,000.00 | 688,500.00 |

01. ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ / සමාගම් පනත යටතේ ලියාපදිංචි ආයතනයක් හෝ පුද්ගලයෙකු විය යුතු අතර, අසාධු ලේඛණ ගත නොවූ සේවා සපයන්නෙකු විය යුතුය.

02. ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ආකෘති පත්‍ර ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් මිලදී ගත හැකි අතර, ලංසු ආකෘති පත්‍ර නිකුත් කිරීම **2026.02.20** දින සිට **2026.03.12** වන දින දක්වා සතියේ වැඩ කරන කාර්යාල දිනවල පෙ.ව. **9.00** - ප.ව. **3.00** දක්වා නිකුත් කරනු ලැබේ.

03. පූර්ව ලංසු සාකච්ඡාව **2026.03.05** දින පෙ.ව. **10.00** ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පැවැත් වේ. එමෙන්ම **2026.03.13** ප.ව. **2.30** ට ඌව පළාත්

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාවේදී ලංසුපත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවන්ට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

04. ලංසු භාර ගැනීම 2026.02.20 දින සිට 2026.03.13 දින ප.ව. 2.00 දක්වා සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාවන් තුළ සිදු කෙරේ. නියමිත දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ කොටසක් පිළිගැනීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 055 - 2231981 විමසීම් කල හැකිය. මුදල් ගෙවීමකින් තොරව මෙම කාර්යාලයේදී ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.up.gov.lk වෙබ් ලිපිනයට පිවිසීමෙන් ද තොරතුරු ලබා ගත හැකිය.

05. ආපසු ගෙවන ලංසු සුරක්ෂණ ගාස්තු වගුවේ සඳහන් පරිදි ඊට අදාල මුදල ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නමින් ඇති, බදුල්ල මහජන බැංකු මුතියංගණ ශාඛාවේ ගිණුමේ අංක 269 – 100188440649 දරණ ජංගම ගිණුමට තැන්පත් කර ඊට අදාල ලදුපත් ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර, කුවිතාන්සි පතක් ලබා ගෙන ලංසු ආකෘති පත්‍රයට අමුණා ඉදිරිපත් කල යුතුය.

06. ලංසු සුරක්ෂණ ගාස්තුව සඳහා බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් වගුවේ සඳහන් වටිනාකමකට යටත්ව අනුමත වාණිජ බැංකුවකින් ලබා ගත් 2026.07.17 දක්වා වලංගු ඉල්ලූ විට ගෙවන, කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ඉදිරිපත් කල යුතුය. (අදාළ ආකෘතිය ලංසු ලියවිලිවල ඇතුළත් කර ඇත)

07. සේවා පළපුරුද්ද. - ඒ ඒ පැකේජය සඳහා පහත සඳහන් ආකාරයට ආරක්ෂක සේවා සපයා පළපුරුද්දක් තිබිය යුතුය.

| අ/අ | පැකේජ අංක | අවශ්‍ය අවම පළපුරුද්ද |
|---|---|---|
| 01 | 01 හා 02 | සමාන ධාරිතාවයකින් යුතු ආයතනයක වසර 03ක ආරක්ෂක සේවා සපයා සේවා පළපුරුද්ද ලබා තිබීම. (මෙම පැකේජ යටතේ ඉල්ලා ඇති ආරක්ෂක නියාමකයන් ප්‍රමාණයක් හෝ ආසන්න ප්‍රමාණයක් සේවයේ යොදවා තිබිම) |
| 02 | 03,04,05,06,10 | සමාන ධාරිතාවයකින් යුතු ආයතනයක වසර 02ක ආරක්ෂක සේවා සපයා සේවා පළපුරුද්ද ලබා තිබීම. (මෙම පැකේජ යටතේ ඉල්ලා ඇති ආරක්ෂක නියාමකයන් ප්‍රමාණයක් හෝ ආසන්න ප්‍රමාණයක් සේවයේ යොදවා තිබිය යුතුය) |
| 03 | 07,08,09 | සමාන ධාරිතාවයකින් යුතු ආයතනයක වසර 01ක ආරක්ෂක සේවා සපයා සේවා පළපුරුද්ද ලබා තිබීම. (මෙම පැකේජ යටතේ ඉල්ලා ඇති ආරක්ෂක නියාමකයන් ප්‍රමාණයක් හෝ ආසන්න ප්‍රමාණයක් සේවයේ යොදවා තිබිය යුතුය) |

*ආසන්න ප්‍රමාණය යනුවෙන් සළකනු ලබන්නේ 75%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.

දුරකථන අංකය:- 055 – 2231981 ෆැක්ස් අංකය:- 055- 2223098
Email – pdhsuvaacc@gmail.com